// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1952/37 – 2016 පෙබරවාරි 03 වැනි බදාදා – 2016.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/10/49/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු, අංක. 08, වසන්තාරාම පාර, මොල්ලිගොඩ, වාද්දුව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්, අංක 35/1, ස්ටබ් පෙදෙස, ඩික්මන් පාර, කොළඹ 04,
02. සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 174/3, කාසල් වීදිය, අල්විස් ඇවනිව්, කොළඹ 08,
03. සෙලින්කෝ ශ්‍රීරාම් සෙකියුරිටීස් ලිමිටඩ් (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී), 16වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962

1A – G 022982 – 77 (2016/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/49/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු, අංක. 08, වසන්තාරාම පාර, මොල්ලිගොඩ, වාද්දුව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්, අංක 35/1, ස්ටබ් පෙදෙස, ඩික්මන් පාර, කොළඹ 04,
02. සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 174/3, කාසල් වීදිය, අල්විස් ඇවනිව්, කොළඹ 08,
03. සෙලින්කෝ ශ්‍රීරාම් සෙකියුරිටීස් ලිමිටඩ් (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී), 16වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ.-**

සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්, සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, සෙලින්කෝ ශ්‍රීරාම් සෙකියුරිටීස් ලිමිටඩ් (පසුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී), යන ආයතනවල සේවය කළ ජී. කේ. පී. ජී. ප්‍රනාන්දු මහතාගේ සේවය 2010.03.31 දින සිට අවසන් කිරීම සම්බන්ධයෙන් වන්දි මුදල් හා පාරිතෝෂික මුදල් ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න සහ එලෙස යුක්ති සහගතවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 547

---

මගේ අංකය: IR/15/44/2009.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.01.28 වන දින අංක 1690/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.01.25 වැනි දින දරන නියෝගයෙන්–

එස්. ඒ. ආරියසේන මයා, අංක 105, පෙලෙන්ගස්තුඩුව පාර, බොරැල්ල, කොළඹ 08

සහ

ජනශක්ති ඉන්ෂුවරන්ස් පී. එල්. සී., (කලින් සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම), ප්‍රධාන කාර්යාලය, අංක 46, මුත්තයියා පාර, කොළඹ 02,

අතර පවත්නා 2010.12.31 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. ජී. ඩීන් මහතා වෙත යොමු කරන ලදී,

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2011.01.25 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

02 - 548/1

---

මගේ අංකය: IR/15/44/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. ආරියසේන මයා, අංක 105, පෙලෙන්ගස්තුඩුව පාර, බොරැල්ල, කොළඹ 08

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජනශක්ති ඉන්ෂුවරන්ස් පී. එල්. සී., (කලින් සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම), ප්‍රධාන කාර්යාලය, අංක 46, මුත්තයියා පාර, කොළඹ 02,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/44/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. ආරියසේන මයා, අංක 105, පෙලෙන්ගස්තුඩුව පාර, බොරුල්ල, කොළඹ 08

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජනශක්ති ඉන්ෂුවරන්ස් පී. එල්. සී., (කලින් සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම), ප්‍රධාන කාර්යාලය, අංක 46, මුත්තයියා පාර, කොළඹ 02,

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,-**

සීමාසහිත ජාතික රක්ෂණ සංස්ථාව යටතේ සේවය කරමින් සිටිය දී 2002.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගමේ සේවයට බඳවා ගනු ලැබූ එස්. ඒ. ආරියසේන මහතාට වයස අවුරුදු හැට (60) දක්වා රැකියාව ලබා නොදීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 548/2

---

මගේ අංකය: IR/15/11/2011.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.03.11 වන දින අංක 1801/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.22 වැනි දින දරන නියෝගයෙන්–

සිසිර ද සිල්වා මයා, "සිසිලස", දුම්රිය ස්ථානය ඉදිරිපිට, කහව

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10,

අතර පවත්නා 2013.01.10 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. ජී. ඩීන් මහතා වෙත යොමු කරන ලදී,

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2013.02.22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

02 - 549/1

මගේ අංකය: IR/15/11/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සිසිර ද සිල්වා මයා, "සිසිලස", දුම්රිය ස්ථානය ඉදිරිපිට, කහව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128 හි, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/11/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සිසිර ද සිල්වා මයා, "සිසිලස", දුම්රිය ස්ථානය ඉදිරිපිට, කහව

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10,

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,-

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමියෙකු වශයෙන් සේවයේ යෙදෙමින් සිටි සිසිර ද සිල්වා මහතා හට අවුරුදු හැට (60) දක්වා සේවය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබියදීත්, ආයතනය විසින් ඔහුව අවුරුදු පනස් අටයි මාස තුනයි දින එකොළහකදී විශ්‍රාම ගැන්වීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 549/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.